# පොදු ජනතාව වෙත සෞඛ්‍ය සංනිවේදනය

**තුසිත මලලසේකර**

සෞඛ්‍යය ප්‍රවර්ධනය, මහජන සෞඛ්‍යය හා රෝගී සත්කාර සේවා යන මේ කවර සෞඛ්‍ය ක්ෂේත්‍රයකට වුව තොරතුරු ව්‍යාප්තිය අතිශයින්ම වැදගත් වෙයි. සෞඛ්‍ය ආශ්‍රිතව ජනතාව අතට පත්වන බොහෝ තොරතුරු ඔවුන්ට සමීප කරනුයේ ජනමාධ්‍යය. එහිදී මුද්‍රිත හා විද්‍යුත් යන මාධ්‍යයන් දෙපාර්ශවයම පෙරමුණේ වෙයි. "ඒඩ්ස්" හෝ "පිස්සු ගව රෝගය" වැනි නව වසංගත පිළිබඳව ,සලකා බැලුවද දුම්පානය, මත්පැන් පානය, අහිතකර ආහාර රටා, ව්‍යයාමයෙන් තොරවීම හා බැඳුන නූතන ශිෂ්ටාචාරය හෙවත් ජීවන රටාව හා සම්බන්ධ රෝග පිළිබඳව සලකා බැලුවද ජනමාධ්‍ය තොරතුරු වාහකයක් ලෙස සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරයි.

මහජනතාවගේ ඇසින් බලන විට මාධ්‍ය ඔස්සේ සෞඛ්‍යමය තොරතුරු හා දැනුම ව්‍යාප්තිය අතිශයින්ම වැදගත් වූ ප්‍රමුඛතාවයක් ලෙස පෙනේ. සෞඛ්‍ය සංනිවේදකයන් සහ මාධ්‍ය විසින් **ප්‍රතිශක්තිකරණ වැඩසටහන, පවුල් සැළසුම් වැඩසටහන** සහ **පෝෂණය නංවාලීමේ වැඩසටහන** ආදී සෞඛ්‍ය වැඩසටහන් වල සාර්ථකත්වය සඳහා ලබාදුන් දායකත්වය අතිමහත්ය. සෞඛ්‍ය පිළිබඳ තොරතුරු ජනතාව අත පත්කිරීමේ වගකීම දරන්නවුන් ලෙස සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥයින් මෙන්ම සෞඛ්‍ය සංනිවේදනයේ යෙදෙන ජනමාධ්‍යවේදීන් එම කාර්ය ඉටු කිරීමෙහි ලා තව තවත් වෙහෙසිය යුතුව ඇත. මෙහිදී සෞඛ්‍ය සංනිවේදකයින් සිත්හි රඳවා ගත යුතු වැදගත්ම කරුණ වනුයේ තමන් රචනා කරන්නේ වෘත්තීමය සඟරාවක පළ විය යුතු විද්‍යාත්මක ලිපියක් හෝ පර්යේෂණ තොරතුරු පත්‍රිකාවක් නොව තම පාඨකයන් හට කියවා තේරුම් ගත හැකි ලිහිල් ලිපියක් බවය. එමගින් අදාළ තේමාව හෝ විෂය පිළිබඳ ඉතා ගැඹුරින් කරන විද්‍යාත්මක විමර්ශනයක් අපේක්‍ෂා නොකරන බව සංනිවේදකයන් දැන සිටීමත් අවශ්‍යය.

සෞඛ්‍ය සංනිවේදකයා විසින් තමන් එක් රැස් කර ගත් සියලු තොරතුරු යළි මැන බැලිය යුතුය. එමගින් සිය පාඨකයන්ට ග්‍රහණය කර ගත හැක. ඔවුන්ට තේරුම් කර ගත හැකි වැදගත් කරුණු පමණක් තෝරා බේරා ගෙන ඒවා ව්‍යාප්තියට උත්සාහ දැරිය යුතුය. සංනිවේදන කුසලතා වලින් පරිපූර්ණ නොවූ සංනිවේදකයකු හට මෙම ක්‍රියාවලිය බෙහෙවින් අසීරු වීමට ඉඩ ඇති බව අප අමතක නොකළ යුතුය.

ඒ අතරම සෞඛ්‍ය පිළිබඳව කියවීමට, ඇසීමට, දැකීමට ජනතාව අතර තද පිපාසයක් තිබිය දී සෞඛ්‍ය පිළිබඳ තොරතුරු හා සෞඛ්‍ය සම්බන්ධව ලිවීම ද්විතියික වැදගත් කමක් පමණක් හිමි තත්වයක් ලෙස සලකන සංනිවේදකයන් දක්නට ලැබීම අරුමයකි. "වෛද්‍යමය" හා "සෞඛ්‍යමය" විෂයයන් "විශේෂිත" විෂයයන් ලෙස සමහර සංනිවේදකයන් බොහෝ විට සලකන නිසාත් ඒ කරුණු ජනතාව වෙනුවෙන් නිවැරදිව ලිවීම සඳහා තරම් දැනුවත් භාවයක් තමන් තුළ නොමැති බව සිතන නිසාත් එසේ වනවා විය හැකිය. මේ අතර වෛද්‍ය විශේෂඥයින් නිතර නගන මැසිවිල්ලක් වන්නේ ද තම ප්‍රකාශයන් නිවැරදි ලෙස ජනතාව අතට පත් කිරීමට මාධ්‍යවේදීන් අසමත් වන බවය. නැතහොත් සෞඛ්‍ය සංනිවේදකයන් තම පණිවුඩ වරදවා වාර්තා කරන බවකි.

සෞඛ්‍ය පිළිබඳ ලිපි සම්පාදනයට පෙරාතුව සෑම සෞඛ්‍ය සංනිවේදකයකුම අදල විෂය හා සම්බන්ධව තම අතට පත්වන සෑම සියලු දෙයක්ම කියවීම අතපසු නොකළ යුතුය. විශේෂඥයා සමග නියමිත සාකච්ඡාවට යන විට තමුන් ද "සුලු විශේෂඥයකු" බවට පත්ව යා හැකි නම් ඒ බොහෝ ප්‍රයෝජනවත් ය. එසේම අදල විෂය හා සම්බන්ධව විශේෂඥයා විසින් පළ කළ හැකි ජනතාවට ආගන්තුක වීමට ඉඩ ඇති වෛද්‍යමය හා තාක්ෂණමය වචන කවරක් විය හැකි ද? යන්න ගැන අවබෝධයක් ඇතිව සාකච්ජාවට යොමුවීමත් ප්‍රයෝජනවත්ය. එමගින් තමන් භාවිතා කිරීමට යන සරල වදන්වල නිවැරදි භාවය විශේෂඥයා ඉදිරියේ දී තහවුරු කර ගැනීමේ අවස්ථාව උදවෙයි.

සෞඛ්‍ය සංනිවේදකයා සහ සෞඛ්‍ය විශේෂඥයා අතර යහපත් සම්බන්ධීකරණයක් සහ අන්‍යොන්‍ය අවබෝධයක් පැවතීම අතිශයින්ම වැදගත්ය. සමහර අවස්ථාවන්හි දී සෞඛ්‍ය සංනිවේදකයින් මෙම කරුණු ඉතා සැහැල්ලුවට ගන්නා අතර ඒ කෙරෙහි නිසි අවධානයක් යොමු නොකරයි. එමෙන්ම සෞඛ්‍ය විශේෂඥයා තුළ ද සෞඛ්‍ය සංනිවේදකයන් සිය කාර්යයන් සිදු කරන ආකාරය හා ඔවුන් ඉදිරියේ ඇති බාධා පිළිබඳවද අවබෝධයක් නොමැත. සාකච්ජාවට ලක්වන තේමාව පිළිබඳව සෞඛ්‍ය සංනිවේදකයා තුළ ඇති දැනුම සීමිත බව සලකා ඔහුට හෝ ඇයට හෝ එය ඉතා හොඳින්, ඉවසිල්ලෙන් හා සරලව තේරුම් කර දීම සෞඛ්‍ය විශේෂඥයාගේ වගකීමකි. හැකි හැමවිටම වෛද්‍ය තාක්ෂණිකමය වචන භාවිතා නොකර පැහැදිලි සරළ භාෂාවෙන් සංනිවේදකයන්ට කරුණු වටහා දීම සිදු විය යුතුය. මේ අතර සෞඛ්‍ය සංනිවේදකයා තුළද තමන්ට නොවැටහෙන කරුණු ගැන නොපැකිල විමසමින් නිවැරදි ලෙස විෂය හා කරුණු වටහා ගැනීමේ උනන්දුවක් පැවතිය යුතුය.

සෞඛ්‍ය සංනිවේදකයා නිරතුරුවම ගම මතකයේ රඳවා ගත යුතු වැදගත්ම කරුණ වනුයේ තමන් මෙම ලිපිය රචනා කරනුයේ තම පාඨකයන් වෙත බවය. ඔවුන්ගේ එදිනෙදා ජීවිතයට බලපාන වැදගත් හෝ අසීරු විෂයයන් තේරුම් බේරුම් කර ගැනීමට ඔවුන් සියලු බලාපොරොත්තු රඳවා ඇත්තේ තමන් වෙත බව ලේඛකයා දැන සිටිය යුතුය. එනිසා සම්මුඛ සාකච්ජාවෙන් පසුවද, එම විෂය පිළිබඳව තව තවත් කරුණු හදාරා, පත පොත කියවා, පාරිභාෂික ශබ්ද මාලා හා ශබ්ද කෝෂ යොදා ගනිමින් සිය ලිපිය හැකි තරම් සරළව හා පැහැදිලිව විස්තර කිරීමට උත්සාහ දැරිය යුතුය. සමහර අවස්ථාවන්හි දී පාරිභාෂිත වචන යොදා ගැනීම නොවැළැක්විය හැකි කරුණක් විය හැකිය. උදාහරණයක් ලෙස විජලනය යන වචනය ගනිමු. ඒ වචනයත් සමග ඇග වියලී යාම යනුවෙන් අර්ථ පැහැදිලි කිරීමක් කළ හැකිය. නොඑසේ නම් උදුරා ගත් කුඩලු පැලැටියක් ජලය නැතිව යන ආකාරය උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

සමහර අවස්ථාවනිහිදී සෞඛ්‍ය විශේෂඥයින් සහ සෞඛ්‍ය සංනිවේදකයන් විරුද්ධ පැති දෙකක රැඳී සිටිනු දැකිය හැකිය. එනිසාම ඒ දෙපිරිසටම ඔවුනොවුන් තේරුම් ගැනීම අසීරුය. සෞඛ්‍ය විශේෂඥයින් බොහෝ විට අවධානය යොමු කරනුයේ දීර්ඝ කාලීන, ගැඹුරින් විග්‍රහ කළ හැකි කරුණු කෙරෙහිය. එහෙත් සංනිවේදකයින් ඉක්මණින් ක්‍රියාත්මක විය යුතුය. එසේම සරල හා ආසන්න ලෙස විචිත්‍රකරණයෙන් යුතු යමක් ඉදිරිපත් කිරීම ඔවුන්ගේ උත්සාහයයි.

අද වර්තමාන අවශ්‍යතාවයව පවතිනුයේ සෞඛ්‍ය විශේෂඥයින් සහ සෞඛ්‍ය සංනිවේදකයන් එක්තරා පොදු ස්ථානයකට අන්‍යොන්‍ය අවබෝධයකින් යුතුව යොමු කිරීමය. සෞඛ්‍යය ප්‍රවර්ධනය කළ හැකි වනුයේ ජනතාව ඒ කෙරෙහි පූර්ණ ලෙස දැනුවත් කිරීම තුළින් පමණක් බව සෞඛ්‍ය විශේෂඥයින් දැන සිටිය යුතුය. සත්‍ය වශයෙන්ම නම් සෞඛ්‍ය තොරතුරු ලෙස ජනතාව වෙත ඉදිරිපත් කළ යුත්තේ පෝෂණය හෝ ආහාර වේල හෝ ස්වස්ථතාවය හෝ පිළිබඳ පැරණි පණිවිඩ පමණක් නොවේ. මේ සංනිවේදන උත්සාහයන් යොමු විය යුත්තේ සෞඛ්‍ය පිළිබඳ මූලික දැනුම් සම්භාරයක් ජනතාව තුළ තැන්පත් කිරීමේ පරම අභිලාශයෙනි. එමගින් ප්‍රජාවට සිය සෞඛ්‍යය ප්‍රවර්ධනය කර ගැනීමට වඩාත් වැදගත් වනවා සහ සහාය වනවා පමණක් නොව අහිතකර හුරු පුරුදු වලින් ඈත් වීමට ද ඉඩකඩ සලසයි. එපමණක් නොව වර්තමානයේ අප මුහුණ දෙන ප්‍රධාන සෞඛ්‍ය ගැටළු පිළිබඳ වඩාත් හොඳින් අවබෝධයක් ලබා ගැනීමටත්, එම සෞඛ්‍ය ගැටළු මර්දනය සඳහා දරන වෑයම් කෙරෙහි ජනතා සහාය වැඩිපුර ලබා ගැනීමේ අවස්ථාව උදාකර දීමටත් එය සමත් වනවා නිසැකය.